## මාතලේ මහා නගර සභාව

### 1 මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 23 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 23 උනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 08 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 මතය

නගරාධිපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතලේ මහානගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.3.1 ගිණම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා තොගයේ වටිනාකම රු.2,671,948 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ). නාගරික සංවර්ධන අධිකාරිය වෙතන් කෙලින්ම බැංකුව වෙත ලද රු.327,356 ක ආදායම්, ගිණුම් ගතකර නොතිබුණි .

(ඇ). සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් අනුව වරිපනම් ආදායම රු.20,318,195 ක් වුවද, වර්ෂයේ වරිපනම් ආදායම රු.22,476,999 ක් ලෙස දැක්වීම නිසා ආදායම රු.2,158,804 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ වරිපනම් සඳහා දෙන ලද වට්ටම් හා බදු සහන එකතු වටිනාකම රු.2,745,002 ක් වුවද, රු.4,837,181 ක් ලෙස වැඩිපුර ගිණුම්ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු වරිපනම් ආදායම හා වර්ෂයේ අතිරික්තය රු.2,092,179 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අංක RC - 1113 දරන ට්‍රැක්ටරයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ). ගිණුම් විෂයයන් 5 කට අදාළව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 165,795,039 ක් වූ අතර උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 159,515,685 ක් වූයෙන් රු.6,279,345 ක වෙනසක් අනාවරණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 08 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගණුදෙනුවල වටිනාකම රු. 25,654,224 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.287,637,511 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,814,652 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.235,911 ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ). 1992 වර්ෂයට අදාළව රු.8,265 ක් වටිනා චෙක්පත් 02 ක්ද, 2009 වර්ෂයට අදාළව රු.71,650 ක් වටිනා චෙක්පත් 04 ක්ද, සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,000 ක් වටිනා චෙක්පත 01 ක්ද, අගරු වී තිබුණද, එම චෙක්පත් පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලසි 189 ට අනුව අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලසි 371 (ඇ) ඡේදයට අනුව,දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිමකළ විගසම පියවියයුතු වුවත්, 1994 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 264 කදී දෙන ලද රු.2,586,042ක අත්තිකාරම්ද සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 06 කදී දෙන ලද රු.54,291 ක අත්තිකාරම්ද දෙසැම්බර් 31 දින වනවිටත්, පියවා නොතිබුණි.

(ඇ). වාර්ෂික අයවැය ලේඛනය මගින් අංක 13478 වැය විෂයයට රු.400,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබියදී 2011 සැප්තැම්බර් 28 දින මාරුපත්‍ර අංක 7 මගින් 12458 වැය විෂයයට රු.300,000 ක් ද, 13458 වැය විෂයයට රු.100,000 ක ද බැගින් සමස්ත ප්‍රතිපාදන මාරු කර තිබුණි. ඒ අනුව ඉහත වැය විෂයයේ ප්‍රතපාදන නොමැතිව තිබියදී ජර්නල් සටහන් අංක FA/ 12/2011 මගින් වර්පනම් බදු සහන සැපයිම වෙනුවෙන් රු.4,837,181 ක මුදලක් 13478 වැය විෂය යටතේ සහා අනුමැතියකින් තොරව වැයකර තිබුණි.

2.3 ආදායම් පර්පාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) .වර්පනම් හා බදු | 16,000 | 22,938 | 11,023 |
| (ii) .බදු කුලි | 6,327 | 15,001 | 4,694 |
| (iii) .බලපත්‍ර ගාස්තු | 15,231 | 4,650 | 47 |
| (iv).වෙනත් ආදායම් | 144,524 | 153,215 | 13,463 |

2.3.2 ආදායම් ප්‍රවර්ධනය

සභාවට පැවරී තිබූ ආදායම් මාර්ගවලින් එකතු කරගත හැකිව තිබූ ආදායම රු.96,078,691 ක් වූ අතර, සභාව පවත්වා ගෙන යාමට වර්ෂය තුල දරන ලද පුනරාවර්තන වියදම රු.181,988,576 ක් විය. ඒ තුල අඩංගු සභාවේ සේවක වැටුප් සඳහා දරා තිබූ වියදම රු.120,876,768 ක් වූ අතර, සේවක වැටුප් ගෙවීම සඳහා හෝ සභාව එකතු කළ ආදායම ප්‍රමාණවත් නොවිය. තවද සභාවට පැවරුණු ආදායම් මාර්ග තුල ආදායම් වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් කිසිවක් අනුගමනය කර නොතිබුණු බවද දක්නට ලැබුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i). උසාවි දඩ | 2,630,350 |
| (ii). මුද්දර ගාස්තු | 4,472,600 |

### 2.3.4 ජල ගාස්තු

සභාව සතු ජල සැපයුම් පද්ධතිය 2004 වර්ෂයේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත පවරා දීමේදී පැවති රු.4,802,812 ක හිඟ ජල ගාස්තු ශේෂය මණ්ඩලයට පවරා දී නොතිබුණෙන් පාරිභෝගිකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු.1,090,455 ක්වූ භෞතික සම්පත් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

## 2.5 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

(අ). සභාව විසින් 2011 වර්ෂයේ රු. 501,451 ක වියදමින් ඉදිකරන ලද හිඟ්ගොල්ල වාහන සේවා ස්ථානයට අදාළව සක්‍යතා අධ්‍යනයක් කර මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර සැලසුම් කමිටුවේ හා සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අතුරු ව්‍යවස්ථා විධිවිධාන සම්මත කර ගැසට් පත්‍රයේ පලකිරීමට ද කටයුතු කර නොතිබුණි. යථෝක්ත සේවා ස්ථානය ඉදිකර ඇති ඉඩමේ කොටසක අනවසර ලෙස පෞද්ගලික නිවසක් ඉදිකර ඇතත්, එය ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ). අංක කේ.එච්.4277 දරන වාහනය අලුත්වැඩියාව හා සේවා කිරීම වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1(ආ) වගන්තියේ විධිවිධාන අනුව අනුමැතියකින් තොරව පුද්ගලික ආයතනයකට අවස්ථා 02 කදී රු.262,627 ක මුදලක් ගෙවා තිබුණි

(ඇ). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 ඡේදයට අනුව වෙළඳපොළ තරඟකාරී පදනමක් අනුගමනය කර භාණ්ඩ හෝ සේවා සපයා ගත යුතු වුවත්, ඊට පටහැනිව කිසිදු මිළ කැඳවීමකින් තොරව රු.242,680 ක් වටිනා පුටු 24 ක් සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබුණි. එසේම මහා නගර සභා ආඥා පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව මුදල් පිළිබඳ ස්ථාවර කමිටු විසින් කලින් සලකා බලා මහ සභාවට වාර්තා කරන තෙක් සභාව විසින් කිසිම මුදල් පිළිබඳ කරුණක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු බව දැක්වෙතත්, සභාවේ හෝ නගරාධිපතිවරයාගේ හෝ අනුමැතිය ලබා නොගෙන මෙම මිළදී ගැනීම සිදුකර තිබුණි. ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 264 විධිවිධාන අනුව ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියක් හෝ කිසිදු ආධාරක ලියවිල්ලක් ඉදිරිපත් කර නොතිබුණි.

2.6 අවිධිමත් ගණුදෙනු

----------------------

(අ). 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීෆ 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව, පළාත් පාලන ආයතනවලට අයත් දේපල රක්ෂණ ආවරණ සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ සී/ස ශ ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලබාගත යුතු වුවද, සභාවට අයත් වාහන පෞද්ගලික රක්ෂණ සමාගමක රක්ෂණය කර තිබුණි.

(ආ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9:3:1 (ආ) ඡේදයට අනුව, රු.100,000 කට වැඩි අලුත්වැඩියා සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගතයුතු වවත්, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව අංක එච්.ජේ.7628 දරන වාහනයට අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අවස්ථා 03 කදී රු.447,013 ක් වැයකර තිබුණි. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2002 ජුලි 25 දිනැති අංක සිපිසී/සීඑස්/9/4/1/6/55 දරන ලිපිය ප්‍රකාරව අලුත්වැඩියාව සතුටුදායකව සිදුකළ බවට අදාළ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර, අමතර කොටස් වාහනයට යෙදූ බවට සහතිකයක් ද ලබාගෙන නොතිබුණි. යථෝක්ත වාහනයට අදාළ ධාවන සටහන් 2009 ජුලි මාසයෙන් පසුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ). නිල ඇඳුම් රෙදි මිලදී ගැනීම.

--------------------------------

සභා නිලධාරීන් හා සේවකයින් සඳහා අවස්ථා 04 කදී ආයතන 04 කින් රු.378,217 ක නිල ඇඳුම් රෙදි මිළදී ගෙන තිබුණි.
පහත කරුනු නිරීක්ෂණය කරනු ලැබේ.

(i). මෙම මිළදී ගැනීමට අදාළ මිල ගණන් කැඳවීමේ ලිපියේ කාර්යාල පිටපතේ ,මිල ගණන් භාරගනු ලබන අවසාන දිනය හා වේලාව 2010 ජූනි 30 දින පෙ.ව. 10.00 ලෙස දක්වා තිබුණද, මිල ගණන් කැඳවන ආයතනවලට යවා ඇති ලිපිවල මිළ ගණන් භාරගනු ලබන අවසාන දිනය හා වේලාව 2010 ජූලි 09 දින පෙ.ව. 10.00 ලෙස දක්වා තිබුණි.

(ii). මිල ගණන් කැඳවීමේදී වර්ගය,ප්‍රමණය ආදි පිරිවිතර විස්තරාත්මකව දක්වා නොතිබීම නිසා මිල ගණන් ඉදිරිපත් කළ ආයතන විවිධ වර්ගයේ සාම්පල් ඉදිරිපත් කර තිබුණි.

(iii). මිළදී ගැනීමේ කමිටුව කිසිදු පදනමකින් තොරව සාම්පල් තෝරා අනුමත කර අවම මිළ ගණන් පිළි නොගෙන අවස්ථා 02 කදී වැඩිමිල ගණන් මතද මිලදී ගැනීම කර තිබුණි.

(iv) 04 දෙනෙකුගෙන් සමන්විත සාම්පල් පරීක්ෂා කිරීමේ කමිටුව දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් මිළදී ගැනීමේ නිර්දේශයන් ලබාදී තිබුණි.

(v). ස්ථාන මාරු ලැබ මෙතෙක් සේවයට වාර්තා කර නොතිබූ ආදායම් පරීක්ෂකවරයෙකු වෙනුවෙන් රු.4,536 ක වටිනාකමැති කාකි රෙදි මීටර් 09 ක් මිළදී ගෙන තිබුණි.

(vi) 2010 අගෝස්තු 31 දින අංක 08:01:25 දරන සභා තීරණය පරිදි නිල ඇඳුම් රෙදි මිලදී ගැනීම සඳහා රු.278,216 ක මුදලක් අනුමත කර තිබුණද, රු.378,217 ක් වැයකර තිබුණෙන් සහා අනුමැතියකින් තොරව රු.100,000 ක් වැඩිපුර වැයකර තිබුණි.

(vii) මෙම මිළදී ගැනීම තුල ඇති රු.142,500 ක් වටිනා තැඹිලිපාට රෙදි මීටර් 375 ක් ගබඩාවේ තිබියදී 2011 වර්ෂය සඳහාද රු.157,500 ක් වටිනා රෙදි මීටර් 375 ක් නැ වත මිළදී ගෙන තිබුණි.

2.7 හඳුනාගත් පාඩු හා හානි

------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී සහ සභාව පවත්වා තිබූ තොරතුරු හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව වටිනාකම ගණනය කර නොමැති ගබඩා තොග විෂයයන් 99 ක ඌණතා නිරීක්ෂණය විය.

2.8 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

------------------------------

(අ). තොග ඌණතා රු.546,237 ක ශේෂයක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමකින් තොරව වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ). 2005 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන මුදල් අයකැමි වංචා කළ මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.26,549 ක ශේෂය පිළිබඳව කිසිදු ක්‍රියාමර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ). ප්‍රධාන ලේකම්ගේ 2008 අප්‍රේල් 19 දිනැති හා අංක සීපීසී/සීඑම්එස්/1/11/11/1 ලිපිය හා මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ1999 නොවැම්බර් 04 දිනැති අංකසීපීසී/සීඑල්ජී/03/01 දරන චක්‍රලේඛයට අනුව, වරිපනම් බදු ලේඛන ලිවීම හා පරීක්ෂා කිරීම සඳහා මහනුවර මහානගර සභාවේ 2008 වර්ෂයට පමණක් අදාල කරගත් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපියක් පදනම් කරගෙන 2011 වර්ෂය සඳහා වරිපනම් බදු ලේඛන ඉදිරි වර්ෂය වෙනුවෙන් ලිවීම හා පරීක්ෂා කිරීම වෙනුවෙන් දීමනා ලබාගෙන තිබුණි. මෙම වරිපනම් බදු ලේඛන 2003 වර්ෂයේදී ලියන ලද ඒවා වන අතර, 2009, 2010 හා 2011 වර්ෂ වෙනුවෙන් එම ලේඛන ලිවීම හා පරීක්ෂා කිරීම වෙනුවෙන් රු.153,292 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ). 2011 ජූලි 29 දින සභාවේ දෛනික රාජකාරි කටයුතුවල යෙදෙන සේවකයින් සේවා කටයුතුවල යෙදීම පිළිබඳ භෞතික පරීක්ෂා කිරීමේදී වී.ටී.නානායක්කාර උද්‍යානයේ සේවයේ යෙදියයුතු සේවිකාවක් රජයේ නිවාසයක සේවය කරන බව නිරීක්ෂණය විය. 2010 ජුනි 05 දින සිට පරීක්ෂණ දිනය වූ 2011 ජූලි 29 දින දක්වා එම සේවිකාව ඉහත උද්‍යානයේ සේවා කටයුතුවල යොදවා තිබුණද, එම කාලය තුළ එකම දිනයක් හෝ එහි සේවය කර නොමැති බව අනාවරණය වූ අතර, 2010 ජුනි සිට දෙසැම්බර් දක්වා රු.135,180 ක්ද, 2011 ජනවාරි සිට ජූලි දක්වා රු.151,315 ක්ද,වශයෙන් කිසිදු සේවයක් ලබා නොගෙන සභා අරමුදලින් වැටුප් වෙනුවෙන් රු.286,495 ක මුදලක් ගෙවා තිබුණි.

(ඉ). රාත්‍රී මුර සේවයේ යෙදවීම පිළිබඳ 2011 ජූලි 29 දින සඳුකළ පරීක්ෂා කිරීමේදී සෝමසුන්දරම් ප්‍රජා ශාලාවේ මුර සේවය සඳහා යොදවා සිටි මුරකරු එම ස්ථානයේ සේවයේ රැඳී නොසිටි අතර, මොහු පෞද්ගලික නිවසක සේවය කරන බව අනාවරණය විය.

(ඊ). 1995 දෙසැම්බර් 27 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 95/9 ගිණුම් චක්‍රලේඛයේ 6 ඡේදයට අනුව, විශ්‍රාම යන නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණයශේෂ පියවා ගැනීමට අවශ්‍ය සියලු පියවර නිලධාරියා අවසන්වරට සේවය කළ ගිණුම් ඒකකය විසින් ගතයුතු බව දක්වා ඇතත්, විශ්‍රාම ගිය නිලධාරීන් 130 දෙනෙකුගෙන් අයවිය යුතු රු.829,381 ක හිඟ ණයශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ). 1994 සිට 2010 කාලපරිච්ඡේදයට අදාල දේපල ණය පොළී රු.2,586,042 ක් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙන් වැය විෂයයන් 03 ක් යටතේ සංවර්ධන යෝජනා සඳහා රු.1,330,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඒවා ඉටු කිරීමෙන් තොරව සභාවේ රැස්වීම් ශාලාවට උපකරණ මිලදී ගැනීම සඳහා රු.1,041,500 ක් මාරුකර තිබුණි.

2.9 නිවාස කුලී අයකිරීම.

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). කම්කරු නිවාසවල නිවාස කුලිය තක්සේරු කිරීම, තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදුකළයුතු වුවත්, නාගරික ලේකම් විසින් පත්කළ නාගරික ඉංජිනේරු, ප්‍රධාන ආදායම් පරීක්ෂක හා ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂක යන අයගෙන් සමන්විත කමිටුවක් විසින් සිදුකර තිබුණි. ගිවිසුමකට එළඹීමෙන් තොරව නිවාස ලබාදී තිබූ අවස්ථා දක්නට ලැබුණි.

(ආ). රජයේ නිවාසවලින් ඉවත් වී ගිය නිලධාරීන්ගෙන් හා සේවකයන්ගෙන් හිඟ නිවාස කුලී හා විදුලි බිල් රු.45,487 ක් හා හිග්ගොල්ල පිහිටි සභාව සතු කම්කරු නිවාසවල පදිංචිව සිට විශ්‍රාම ගිය කම්කරුවන්ගෙන් රු.48,080 ක් අයවිය යුතුව තිබුණද, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ 6:1 ඡේදය උපලේඛනගත නිවාස නොවන රජයේ නිවාසයක පදිංචි වී සිටිය හැකි උපරිම කාලය වර්ෂ 05 ක් වුවද, එම කාලසීමාව ඉක්මවා නිවාසවල පදිංචි වී සිටි අවස්ථා 06 ක් අනාවරණය විය.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය
(ආ). අභ්‍යන්තර පාලනය
(ඇ). මූල්‍ය පාලනය
(ඈ). ආදායම් පරිපාලනය
(ඉ). වත්කම් කළමනාකරණය
(ඊ). තොග පාලනය
(උ). ණයගැති හා ණයහිමි පාලනය